ii.

ඉක්බිත්තෙන් සමනොළ සමන් දෙවි රජ්ජුරුවන් ආදි වූ ලක්දිව ඒ ඒ පර්වතවල, වෘක්ෂවල අරක් ගෙන වසන දිව්‍යසේනාව අවුත් බුදුන් පිරිවරා වැඳ නො එක් පූජා භාණ්ඩ ගෙන සිටියහ. එ කෙණෙහි බුදුහු බණ වදාරා ශතසහස්‍ර දෙවියන් සසරින් මුදා වදාළ සේක. එ වේලෙහි සෝවාන් වූ සමන් දෙවි රජ්ජුරුවෝ බුදුන් වැඳ සිට ''ස්වාමීනි ! නුඹවහන්සේගේ බුද්ධොත්පාදය මුළුල්ලෙහි මේ ලක්දිව යක්ෂවාස නො වන පරිද්දෙනුත්, අප වැඳ පුදා ගන්නා පරිද්දෙනුත්, පාරිභොගික ධාතුවක් දෙවා වදාළ මැනවැ'යි ආරාධනා කළහ. එ වේලෙහි ස්වාමිදරුවෝ සුරක්ත වූ ශ්‍රීහස්තයෙන් ශිරොධාතුව පිරිමැද කෙශධාතු මිටක් දී වදාළ සේක. සමන්දෙවි රජ්ජුරුවෝ රුවන්කරඬුයෙකින් කෙශධාතු පිළිගෙන බුදුන් වැඩහුන්නාවූ ස්ථානයෙහි රුවන් රැසක් පිටට වඩා සත් රියන් උස ඉඳුනිල්මිණි කරඬුයෙකින් වසා, අප්‍රමාණ වූ දිව්‍යගන්ධ කුසුමාදියෙන් පූජා කළහ. මෙසේ බුදුහු පළමුවන ධාතු ප්‍රතිෂ්ඨාව කොට ලක්දිව සිසාරා තුන්යලක් ප්‍රදක්ෂිණා කිරීමෙන් අරක් දී වෙළුවනාරාමයට වැඩි සේක. පසු ව සරභූ නම් මහතෙර කෙනකුන් වහන්සේ බුදුන්ගේ ග්‍රීවාධාතුව වඩා මේඝවර්ණ වූ පාෂාණයෙන් දොළොස් රියන් උස ඒ වසා සල දාගබක් මවා මහත් වූ පූජා කළ සේක. පසු ව චූළාභය නම් රජෙක් ඒ මතුයෙහි තිස්රියන් මහසෑයක් බැඳවා හොග පමණින් පූජා කෙළේ ය. පසු ව දුටුගැමුණු රජ ඒ වසා අසූරියන් උස මහසෑයක් බැඳවා සතරන් පතින් වසා ධන පමණින් පූජා කෙළේය. එසේ හෙයින් කීයේ මැ නෝ මහාවංශයෙහි:

(පූජාවලිය, කිරිඇල්ලේ ඤාණවිමල සංස්. 752 පිටුව.)

iii.

එකල්හි සිටුදියණියෝ ද ඒ අස් පැටවා මහත් වූ ආරක්ෂාවෙන් පෙම්බර දරුකෙනෙකුන් මෙන් වඩමින් ඔහු ආකාශයෙන් යන ඍද්ධි ඇති බව දැන දවසින් දවස වඩ වඩා ඉඳුරා පොෂ්‍යය කෙරෙමින් සිතන්නාහු ''දැන් මා විසින් කුසල් කිරීමට සහායෙක් ලබන ලද්දේය; මම වනාහි මීට පූර්ව භාගයෙහි සපිරිවර පස්මරුන් බිඳ බුදු වූ බුදුරජාණන් වහන්සේගේ ජය මහා බෝධීන් වහන්සේ පිහිටි මාරසංග්‍රාම භූමි වූ මහාබොධි මණ්ඩලයට නොගියව්රිමි; එසේ හෙයින් මහා මණ්ඩලාදි වූ ත්‍රිවිධ මණ්ඩලයෙන් අලංකෘත වූ දඹදිව මධ්‍ය මණ්ඩලයට නාභිමණ්ඩලයක් හා සාදෘශ්‍ය වූ ශ්‍රී මහා බොධි මණ්ඩලයට ගොස් බුදුන්ගේ සවනක් රස් විහිදුනාවූ ජයමහා බෝධීන් වහන්සේ වැන්දෙමි නම් යෙහෙකැයි සිතා රන් රිදී මල් ආදි වූ බොහෝ පූජාඋපකරණ සපයාගෙන එක්දවසෙක අශ්වරාජයා පිටට පැනනැඟී අහසින් ගොසින් මහ බෝ මළුයෙහි සිට ශ්‍රී මහා බෝධීන් වහන්සේට රන්මල් පුදනු පිණිස රහතන් වහන්සේ වඩනා සේක්වයි අඬගා කියන්නාහු ''යම් අවස්ථාවෙක පටන් මම පිරිසුදු සිත් ඇති ව බුඩ ශාසනයෙහි පහන් වීම් ද ඒ සත්‍ය වචනය හේතුකොට ගෙන මා කෙරෙහි අනුග්‍රහ බුධීන් බුධපුත්‍ර වූ ආර්ය ශ්‍රාවකයන් වහන්සේ නොලස් ව අවුත් ශ්‍රී මහා බොධීන් වහන්සේට සකසා රන් රිදී මලින් පූජාකොට වඳනා පිණිස වඩනාසේක් ව''යි කියා හඬගෑහ. ඒ වචනය දිවකණින් අසා සිංහලද්විපවාසී වූ බොහෝ රහතන් වහන්සේ පෙළ සැදී පියුම් විලකට ගමන් ගත් පද්මමධුලොල හංසසෙනාවක් සේ අහසින් අවුත් බොධිමණ්ඩලයට බැස රන් රිදී මලින් බොධීන්වහන්සේට පූජාකොට සාදරාවනත උත්තමාංගයෙන් නමස්කාර කෙරෙමින් වැඩිසේක. එසේ හෙයින් කියන ලදී;

(සද්ධර්මාලංකාරය, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ සංස්., 355 පිටුව).

## ll කොටස

(2) පසු කාලීන සම්භාව්‍ය සිංහල ගද්‍ය කෘති හා සසඳන කල අමාවතුරේ කතා කලාවේ විශේෂතා කවරේ දැයි සාකච්ඡා කරන්න.

(3) අසන-කියවන ජනයා තුළ භක්ති රසය කුළු ගැන්වීම පිණිස පූජාවලී කතුවරයා උපයෝගී කර ගත් රචනෝපක්‍රම කවරේ දැයි විමන්න.

(4) පූජාවලිය 'බෝධිසත්ව පාරමිතාවෙන් යුතු බණක්' ලෙස හැඳින්වීම කොතෙක් දුරට යෝග්‍ය දැයි පැහැදිලි කරන්න.



(5) 'බුදු සිරිත පමණක් නොව බොදු ගිහි පැවිදි වත් සිරිත් ද ගෙනහර පෑම සද්ධර්මාලංකාරයේ අරමුණ විය'. මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

## lll කොටස

(6) "පෙරපර වණන් නිසි විදිනි ගළපනු සඳ නම්." සිදත් සඟරාවේ සන්ධි විග්‍රහය සඳහා උක්ත නිර්වචනය කොතෙක් දුරට ගැළපේ දැයි සාකච්ඡා කරන්න.

(7) "නමින් පර වැ බෙදනු ලබනුයේ විබත් නම්." සිංහලයේ විභක්ති විග්‍රහය සඳහා උක්ත නිර්වචනයේ යෝග්‍යතාව පැහැදිලි කරන්න.

(8) "කියොලත එක අරුත - සබඳ වැ සදන් නනරුත්
එ වියූ සමස් විදි නම් - එහි බේ දැන් පවස්මෝ."
සිංහලයේ සමාස හැඳින්වීම සඳහා උක්ත නිර්වචනය කොතෙක් යෝග්‍ය දැයි විග්‍රහයක යෙදෙන්න.

9. පහත දැක්වෙන වාක්‍යවල සදොස් තැන් ඇතොත් ඒවා නිදොස් කර ලියන්න.

i. නාහිමි දහම් දෙසති.
ii. කැම්පස් ගිය කිසිවෙකු නවක වදය වදයක් සේ නොදකී.
iii. වැස්සකටවත් කැම්පස් නොගිය අය නවක වදය ගැන බොහෝ පඩි වදන් දෙයි.
iv. ගුරු සංගම් හිරගත කළ ගුරු තුමිය වෙනුවෙන් ක්‍රියාත්මක විය යුතුයි.
v. කිරි-කිරි සමග ද, ගිතෙල්-ගිතෙල් සමග ද, සැසඳෙන්නා සේ කලණ සිත් ඇත්තෝ කලණ සිත් ඇත්තන් හා සැසඳේ.
vi. ඔවුහු අයථා අයුරින් උපයාගත් ධනය භාවිතා කිරීමට විවිධ උපක්‍රම යොදාගන්නා ගනී.
vii. පියා හෙවත් තාත්තා අපගේ ගෘහ මූලිකයා ද වේ.
viii. රටවැසියෝ සුවසේ වෙසෙතියි පාලකයන් සිතයි.
ix.. සෑම කැලයක ම වන සත්තු ඇත.
x. එම නිවසේ සිටින්නේ මහල්ලෙක් පමණි.

(02 සිට 09 දක්වා පිළිතුරුවලට ලකුණු 15 බැගිනි).

**UNIVERSITY OF PERADENIYA**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර - පැරණි නිර්දේශය) පරීක්ෂණය - 2022**
**கலைத்தேர்வுப் பரீட்சை (வெளிவாரி–புதிய பாடத்திட்டம்) 100 வது தேர்ச்சி மட்டம் – 2022**
**Bachelor of Arts (External - Old Syllabus) Examination - 2022**

**SLG II** - පැරණි ගද්‍ය සාහිත්‍යය, භාෂාව හා ව්‍යාකරණය

කාලය පැය(03) තුනයි.
மூன்று(03) மணித்தியாலங்கள்.
Time three (03) Hours.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.
Marks will be deducted for illegible hand writing.

පළමු වන හා නව වන ප්‍රශ්නය ඇතුළුව
ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

------ வினாக்களுக்கு மட்டும் விடையளிக்க.
Answer ------ questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 09කි.
இந்த வினாப்பத்திரத்தில் —- வினாக்கள் உள்ளன.
There are ------- questions in the question paper.

---

## 1 කොටස

(1) (අ) පහත දැක්වෙන පාඨ තුන (3) ලිහිල් බසින් ලියන්න. (ලකුණු 10 + 8 + 7 = 25)

(ආ) පහත දැක්වෙන පාඨ තුනෙහි (3) ඉරි ඇඳි පද අතුරින් පහකට (5) විවරණ සපයන්න.
(ලකුණු 3 × 5 = 15)

i.

එ දවස් බුදුහු දෙව්රම්හි වෙසෙමින් අලුයම් සමාහි ලො බලන්නාහු අඟුල්මල් සොරහු දැකැ ''මා ගිය කලැ ඔහුට සෙත් වෙයි. ගම් නැති තැනැ මහ වල්හි සිටියෙ සිවුපදගයක් අසා මා කෙරෙහි පැවිජි වැ රාත් වෙයි. ඉදින් නො ගියෙම් නම්, මව මරා සසරින් නො නැගිය හැකි වෙයි. ඔහට සඞ්ග්‍රහ කළ මැනැවැ''යි පෙරවරු සුගත් මහපහුල් හැඳැ පෙරෙවැ නුවර වැදැ වළඳා වෙහෙර ගොස් ඔව්හට සඞ්ග්‍රහ කටටි වැ දෙව්රමින් නික්මැ අධන්මඟ පිළිපන්හු. එ කල්හි ගොන් රක්නාහු වස්සන් රක්නාහු සහන්නාහු ගමන් යන්නාහු බුදුන් එකලා වැ බුදුරැස් නො විහිදැ වඩනුවන් දැකැ නො හැඳිනැ ''මහණ, එ මගට නො යා. එ මඟැ අඟුල්මල් නම් සොරෙකැ, දරුණැ, ලෙහෙ මුඬු අත් ඇත්තෙ යැ, සතුන් කෙරෙහි කුළුණු නැත්තේ යැ, ගම් නොගම් කෙළෙ, නියම් ගම් නොනියම්ගම් කෙළෙ, දනවු නොදනවු කෙළෙ, මිනිසුන් මර මරා ඇඟිලි විදැ මාලා කොටැ ධරයි. මහණ, තෙල මඟට පුරුෂයො දස දෙන දූ විසි තිස් සතලිස් පනස් දෙන දූ සැක ඇති වැ සන්නධ වැ වග වග වැ යෙති. ඔහු දූ අඟුල්මල් සොරහු අතැ නස්ති'' කීහ. බුදුහු ඔවුන් තුන් යලක් කියතුදු නො බැණැ නැඟී වැඩියො.

(අමාවතුර, කෝදාගොඩ ඤාණාලෝක සංස්. 133 පිටුව).

(ii) පාරිසරික වස්තූන් අවස්ථාවෝචිත ලෙස හසුරුවාලීමට කව්සිළුමිණ කවියා දක්වන සාමර්ථ්‍යය උක්ත පද්‍යයන් ද ඇසුරු කරමින් පෙන්වා දෙන්න.

(ආ) (i) පහත දැක්වෙන පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

(i)
සඳ මිණි නිල් සැඳලිය ලිය වත කම ල
දැක නොමලත පුල් පියුමැයි කර කුහු ල
දි සි පිළිබිඹු තුරුසෙන් සමඟින් සක ල
ළ දූ රන ලොබින් බට වැනි බට පියුම් අ ල

(ii)
එපුරෙහි සරන අබිසරු ලිය සොර බැව් නි
සොබමන් විමන් දොර මිණි පහණ වසම් නි
මල්දම් සුමුළු කර තිල ගත සල අති නි
ගෙලෙමිණි පැමිණි පණිඳකු ගත් එ කග වැ නි

(මයුර සන්දේශය: ඩබ්.එෆ්. ගුණවර්ධන සංස්: 8-9 පද්‍ය)

(ii) මයුර සන්දේශ කවියා සතු පරිකල්පන ශක්තිය පිළිබඳ විවරණයක් කරන්න.

(ඇ) (i) පහත සඳහන් පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

(i)
බොරු වේ මතුරු බැඳ
වලහත ලෙවන් හැම සඳ
බමුණන් ගෙන් දුලඳ
වැඩක් වූයේ ලොවට කි කල ද

(ii)
ගහයෝ නම් අඹර
දෙවියෝ ය ළඟ සුර පුර
නො ගනිති අන් අහර
උදක් අම රස මිසක් මනහර



(iii)
එයිත් උන් පෙර කළ
කුසලින් උපන් නිකසළ
අනික් කෙනකුන් කළ
දෙයක් උදෙසා නො වෙයි එ පහළ

(iv)
සිඳු දිය ලෙස නිසග
පමණ නොකළැ'කි සැප සග
නර ලොව සැපත රඟ
රැඳුණු පිනි බිඳු වැන්න තණ අග

(v)
සිවු සිය ගවු අසල
වූ නම් නරෝ යම් කල
දෙවියෝ තමන් ගෙල
දැවටී කුණු සේ කෙරෙති පිළිකුල

(බුදුගුණ අලංකාරය: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තු සංස්කරණය: 137-141 පද්‍ය)

(ii) සජීව ලෙස අවස්ථා නිරූපණය කරණු පිණිස බුදුගුණ අලංකාර කවියා දක්වන කුසලතාව උක්ත පද්‍ය ද ඇසුරු කරමින් පැහැදිලි කරන්න.

(ලකුණු 40 යි)

## II කොටස

2. සියබස්ලකරෙහි අන්තර්ගත මහාකාව්‍ය ලක්ෂණ පිළිබඳ විවරණයක් සපයන්න.

(ලකුණු 20 යි)

3. රස සංකල්පය පැහැදිලි කොට, එය නූතන කාව්‍ය විචාරයෙහි ලා ද යොදා ගත හැකි අයුරු පෙන්වා දෙන්න.

(ලකුණු 20 යි)

(අනෙක් පිට බලන්න)

4. "කෝලංකාරෝ අනයා විනා" යන පාඨය පිළිබඳ ප්‍රාමාණික රචනයක් ලියන්න.

(ලකුණු 20 යි)

## III කොටස

5. ශෘංගාර රසය උත්පාදනය කිරීමෙහි ලා කව්සිළුමිණ කවියා දක්වන කුසලතාව සනිදර්ශනාත්මක ව පෙන්වා දෙන්න.

(ලකුණු 20 යි)

6. අවස්ථාවෝචිත ලෙසත් ප්‍රස්තුතයට උචිත ලෙසත් කාව්‍යමය ආකෘතිය හසුරුවාලීමට මයුර සංදේශ කවියා දක්වන කෞශල්‍යය නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20 යි)

7. බුදුගුණ අලංකාරය වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම බුදුගුණ අලංකාරාත්මක ලෙස ප්‍රකාශ කරන කාව්‍යයක්දැ'යි විමර්ශනය කරන්න.

(ලකුණු 20 යි)

8. කෝට්ටේ යුගය සිංහල පද්‍ය කාව්‍යයේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්වීම කෙතරම් යුක්තියුක්ත දැ'යි විමර්ශනය කරන්න.

(ලකුණු 20 යි)



UNIVERSITY OF PERADENIYA

CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර - පැරණි නිර්දේශය) පරීක්ෂණය - 2022
கலைத்தேர்வுப் பரீட்சை (வெளிவாரி–புதிய பாடத்திட்டம்) வது தேர்ச்சி மட்டம் – 2022
Bachelor of Arts (External - Old Syllabus) Examination - 2022
සිංහල

කාව්‍ය විචාරය; පැරණි පද්‍ය සාහිත්‍යය; සාහිත්‍යය වංශය
SLG III

කාලය පැය(03) තුනයි.
மூன்று(03) மணித்தியாலங்கள்.
Time three **(03)** Hours.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.
Marks will be deducted for illegible hand writing.

පළමු වන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න. II, III කොටස්වලින් එක් ප්‍රශ්නයක් වත් තෝරා ගත යුතු ය

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 08කි.
இந்த வினாப்பத்திரத்தில் —— வினாக்கள் உள்ளன.
There are ------- questions in the question paper.

------ வினாக்களுக்கு மட்டும் விடையளிக்க.
Answer ------ questions only.

---

## I කොටස

1. (අ) (i) පහත දැක්වෙන පද්‍ය ලිහිල් බසින් ලියන්න.

(i) මී කපුරු ගරු දුමින් සපු දුනුකේ ලඹ[1] දුන්
මලිගිය මල්දම්ලැල්[2] නරඟ රඟ බිම් වූ හල්[3]

(ii) මලිගිය මල්දම් සදල මහනෙල ඇසහි[1]
සලසා ගතෙව් මල්හී යස කෝ තෙදේ[2] නරවරා

(iii) මමන පොද වත්සුන්[1] පැහැසර[2] සරඟ මල්දම්
බඳ මුහුළස හඟවා ගනකුළුවට සුරිඳු[3]සැව්

(iv) දිමුතු මුතු බරණින් මල්දියුලින්[1] රඳනා
සැදිණි මෙද[2] නිරිඳුසඳ පෙබයී[3] හා මනකුමුදු

(v) පමාලිය කුමුදු හර පොකුරුකුරු[1]නෙත්මින්
මිහිකළ පියුම් හල් විල් බිජ් මීලිල් රජහස්

(කව්සිළුමිණ: ඇම්.බී. ආරියපාල සංස්: 282-286)

(අනෙක් පිට බලන්න)